**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2019**
**-----------------------------------------------------------------------------------------------------**

**1.1 මතය**
**------**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**-----------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණනය විෂය පථය

-----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්ම සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණයේ විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නාලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධ හෙළිදරව් කිරීම්වල සාධාරනත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි. | 2019 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව සකස් කරමින් පවතින අතර ඉදිරියේදී ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 756 දරන මුදල් රෙගුලාසිය | මූල්‍ය ප්‍රකාශන අනුව පිරිවැය රු.6,334,208 ක් වූ වත්කම් සම්බන්ධයෙන් 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි. | පිළිගනිමි ඉදිරියේදී සිදු කිරීමට අපේක්ෂිතයි. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන හා මූල්‍ය කටයුතු 2019 මාර්තු මස ආරම්භ කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.7 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.10,000,000 ක් අරමුදල් කළමනාකරණ ඉතිරිකිරීම් ගිණුමක ආයෝජනය කර තිබුණි. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලද රුපියල් මිලියන 7 ක මුදල සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් මෝටර් රථය මිලදී ගැනීමට නිර්දේශ කොට භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබෙන තුරු රුපියල් මිලියන 7 ක මුදල වඩාත් ඵලදායී මූල්‍ය පරිපාලනයක් ලෙස අරමුදල් කළමණාකරණ ගිණුමට තැන්පත් කිරීමට කළමනාකරණ කමිටුව තීරණය කරන ලදී. 2019 දෙසැම්බර් ගිණුම විවෘත කර වාර්ෂික අයවැයෙන් ලද 2019 අග වන විට චෙක්පත් නිකුත් නොකළ රුපියල් මිලියන 3 ක මුදලද සමඟ රුපියල් මිලියන 10 ක් තැන්පත් කරන ලදී. මෙම මුදල තුල ඇති ගෙවිය යුතු ප්‍රාග්ධන වියදම් වන රුපියල් මිලියන 1.3 ක මුදලින් කොටසක් මේ වන විට ගෙවා ඇති අතර එම මුදලින් අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය අඩු වී ඇත. | වර්ෂය සඳහා ලබා ගන්නා මුදල් එම වසර තුළදීම වියදම් කිරීම කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

2017 වර්ෂයේදී ආරම්භකර තිබුණු මෙම ආයතනයේ සමාලෝචිත වර්ෂයේ ආරම්භක මූල්‍ය ප්‍රකාශන අනුව මෙහෙයුම් ප්‍රතිඵලය රු. 446,530 ක ඌනතාවයක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කළමනාකරණ මණ්ඩලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අනුමැතිය ඇතිව සියළුම පශ්චාත් උපාධි (MD) විෂය මාලාවන් සඳහා පත්කර තිබුණු අධ්‍යයන මණ්ඩල (Board Of study) 03 හි (ආයුර්වේද, යුනානි සහ සිද්ධ) විෂය මණ්ඩල 11 ට අදාළ විෂය නිර්දේශ සඳහා කළමනාකරණ මණ්ඩලයේ, කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතු වුවද 2020 අගෝස්තු 21 වන විට එයින් විෂය මණ්ඩල 2 ක් සඳහා පමණක් සම්පූර්ණ අනුමැතිය ලබාගෙන තිබුණි. | පාඨමාලා දෙකක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. පාඨමාලා තුනක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ ඒකකයෙහි සහ දේශීය වෛද්‍ය විද්‍යා විෂයයට අදාල ස්ථාවර කමිටුවේ නිර්දේශය ලැබී කළමනාකරණ කමිටුවට යොමු කිරීමට නියමිත බවත් ,පාඨමාලා 3 කට අදාළව 2020 වර්ෂය තුළ ,අදාළ අනුමැතීන් ලබා ගැනීම පිණිසඅදාල අයදුම්පත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතද, පාඨමාලා 4 කට අදාල අයදුම්පත් සනාතන සභාවට ඉදිරිපත් කිරීම පිණිස කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය වෙත යොමු කර ඇති බව. | පාඨමාලා සඳහා අනුමැතිය ලබා ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2017 දෙසැම්බර් 06 දින සිට ස්ථාපිත කිරීමෙන් පසු දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය විසින් 2016/2019 පශ්චාත් උපාධි MD(AYU) පාඨමාලාව සඳහා බඳවාගෙන වසර 2 ක න්‍යායාත්මක පුහුණුව අවසන් කර තිබුණු සිසුන් 31 දෙනෙකු ස්ථාපිත නව ආයතනයට අන්තර්ග්‍රහණය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | සම්මුඛ පරීක්ෂණවලදී තෝරාගත් සිසුන් 31 කට පාඨමාලා ආරම්භ කරන බවත්, අදාළ මුදල් ගෙවා ලියාපදිංචි වන ලෙස ලිපි සහ විද්‍යුත් ලිපි මඟින් දැනුම් දුන් අතර ඒ අනුව සිසුන් 24 දෙනෙකු පාඨමාලා සඳහා ලියාපදිංචි වී ඇත. මේ අතරින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් 5 දෙනෙකු සඳහා දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ඔවුන් සිදු කළ අධ්‍යයන කටයුතු සලකා මාස 6 සහ අවුරුද්ද වශයෙන් අධ්‍යයන කටයුතු නිදහස් කිරීමක් සිදු කර ඇත. මේ වන විට ශිෂ්‍යයන් 19 දෙනෙකු අධ්‍යයන පාඨමාලා 5 ක් යටතේ 2020.08.17 වන දින සිට සිය අධ්‍යයන කටයුතු සිදු කරමින් පවතී. | දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය විසින් ලබා දෙන ලද න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ඇඟයීමට ලක් කර අන්තර්ග්‍රහණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 සැප්තැම්බර් 26 දින කළමනා කරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර පැවති කාර්ය මණ්ඩල තනතුරු 7 කට අදාළව නිළධාරීන් 16 ක් වූ අතර ඉන් නිළධාරීන් 14 ගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට 2020 ජුනි 23 දින වන විටද අපොහොසත් වී තිබුණි. | 2018 සැප්තැම්බර් 26 දින අදාල තනතුරු අනුමත කර තිබුණද මෙම ආයතනය විධිමත්ව ආරම්භ කරන ලද්දේ පළමු කළමනාකරණ මණ්ඩල රැස්වීම පැවැත්වීමෙන් පසු 2019 මාර්තු මස සිටය. අනුමත කාර්ය මණ්ඩලය 16 වන අතර කාර්මික නිළධාරි සහ රියදුරු කළමනාකරණ සහකාර තනතුරු 05 වැඩ සහායක තනතුරු 02 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 876 යටතට ඇතුළත් තනතුරු වේ. 2019 සැප්තැම්බර් මාසයේ පැවති අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ වැඩවර්ජනය, ජනාධිපතිවරණය නිසා සියළු බඳවාගැනීම් නතර කරන ලෙස මහාභාණ්ඩාගාර ලේඛම්ගේ 2019.11.20 ලිපිය හේතුවෙන් 2019 වර්ෂය තුළ මෙම බඳවාගැනීම සිදු කිරීමට නොහැකි වී ඇත.<br>කළමනාකරණ සහකාර (පොත් තැබීම) තනතුරට අදාළ බඳවාගැනීම් කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. | ස්ථිර පදනමින් පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ක්‍රියාකළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව ආයතනය විසින් දැනුවත් වී තිබුණද ආයතනයට අදාළ කර ගත හැකි තිරසර සංවර්ධන, ඉලක්ක හා අරමුණු ද එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකග වෙමි.<br>2021 වසර සඳහා ආයතනික සැලසුම සකස් කිරීමේදී ඒ සඳහා ඇතුලත් කිරීමට කටයුතු කරමි. | ඉලක්ක හා අරමුණු ද එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |